# මුතු කිරිල්ලී සමග රංගනයෙන් පියාසර කිරීමට

එච්.ඒ .පෙරේරා

ප්‍රියා රණසිංහ

විජේරත්න වරකාගොඩ

දීපානි සිල්වා

අයිරාංගනී සේරසිංහ

වත්සලා දියලගොඩ

නිරෝෂන් විජේසිංහ

මේනක රාජපක්ෂ

හර්ෂ බුලත්සිංහල

නෙහාරා පීරිස්

අජිත් ලොකුගේ

සුරංගී කෝසලා කුමාරි

කාන්ති ෆොන්සේකා

ආදරයේ අහ නටු ලඟ ජීවිතයේ සෙම්බිම සොයනා අපේ කිරිල්ලී මුතු කිරිල්ලී

# මුතු කිරිල්ලී

පාරම්පරික උරුමයෙන් ලද Royal Food නම් ව්‍යාපාර ජාලයේ හිමිකාරිය වන ෂෙරීන් ධනවත් කාන්තාවකි. සියල්ල සැළසුම්කර නියමිත වේලාවට, නීතියට සිදු කරන ෂෙරීන් ව්‍යාපාරය පුරාම ආධිපත්‍යයක් පතුරවා සිටී. එය නිවස තුළද ක්‍රියාත්මක ආධිපත්‍යයකි. ෂෙරීන්ගේ සැමියා වන වික්‍රම රණබාහු විශ්‍රාමික පරිපාලන නිලධාරියෙකි. විශ්‍රාම ගැනීමෙන් පසු නිහඬව සමාජ සේවා කටයුතු කරගෙන යන ඔහු බුද්ධිමත් නිහඬ තැනැත්තෙකි. රණබාහු නිවසේ ම වෙසෙන වැන්දබෝනා නම් අවිවාහක කාන්තාව ඈත අතීතයේ පටන් ම Royal Food හි පරිපාලන කටයුතු වලට මග පෙන්වූ කාන්තාවය. ෂෙරීන් තම ජීවිතයේ හා ව්‍යාපාරයේ සියල්ල කාලය හා මුදල් මත තීරණය කරන්නේ වැන්දබෝනාගේ මග පෙන්වීම යටතේය. කාන්තාවන් දෙදෙනාගේ මෙකී තත්ත්වයන් වික්‍රමගේ උපහාසයට ලක්වන අතර, වික්‍රමගේ සමාජසේවා කටයුතු සඳහා ඔවුන්ගේ විරෝධය සහ බාධා මතු වේ. නමුත් ගුර ව්‍යාපාරික ඥාණයක් සහිත ෂෙරීන් හා වැන්දබෝනා, වික්‍රමගේ සමාජ සේවා කටයුතු තම ව්‍යාපාරයේ වාසි සඳහා යොදාගන්නා අවස්ථා ද බහුල වේ. ෂෙරීන්ගේත් වික්‍රමගේත් වැඩිමහල් පුතු පූර්ණ රණබාහුය. ඔහු එංගලන්තයේ වෛද්‍යවරයෙකු ලෙස සේවය කරන අතර, කෙටි නිවාඩුවකට ලංකාවට පැමිණ,තම මිතුරු වෛද්‍යවරයකු වූ දේවකගේ පෞද්ගලික රෝහලේ සේවය කරයි. මාධවී රණබාහු පවුලේ වැඩිමහල් දියණියයි. මනෝජ් වංශනායක සමග විවාහ වී සිටින මාධවී, මනෝජ්ගේ වංචාසහගත කටයුතු නිසා පීඩා විඳින්නියකි. නමුත් ඇයද බොහෝ අවස්ථාවල උපක්‍රමශීලීව තම අරමුණු ජයග්‍රහණය කරයි. මුලදී මනෝජ්ට විරුද්ධව කටයුතු කළ ද ක්‍රමයෙන් මනෝජ් සමග සහයෝගයෙන් විවිධ උපක්‍රම යොදයි. රණබාහු පවුලේ බාල දියණිය සමාධි රණබාහුය. එංගලන්තයේ හෝටල් හා ආහාර පිළිබඳව උපාධි පාඨමාලාවක් හැදෑරූ ඇය සිය සොහොයුරු පූර්ණ සමගම ලංකාවට පැමිණෙයි.

ෂෙරීන්ගේ හා වැන්දබෝනාගේ මග පෙන්වීම යටතේ, සමාධිට Royal Food හි සේවයට යෑමට සිදුවන්නේ තමා රණබාහු පවුලේ දරුවෙකු බව සඟවාගෙන, පුහුණුවන සූප වේදිනියක ලෙසිනි. ඇය එහිදී පෙනී සිටින්නේ මුතු නමිනි. ඇයට අනුපම විජේවර්ධන නම් සූප වේදියා මුණ ගැසේ. කෙලිලොල් තරුණයෙකු වන අනුපම ජාතික ක්‍රිකට් කණ්ඩායමට ක්‍රීඩකයෙකු ලෙස ඇතුල් වීමේ අරමුණින් යුතුව කටයුතු කරන අතර, Royal Food හි සූපවේදියෙකු ලෙස කටයුතු කරන්නේ, ඊට අවශ්‍ය මුදල් උපයා ගැනීමේ අරමුණිනි. සාමාන්‍ය පවුලක තරුණයෙකු වන අනුපමට එක් සොයුරෙකි. ඒ කෝසලය. උසස් පෙළ දෙවැනි වරටත් පෙනී සිටීමට සූදානම් වේ. දැඩි ක්‍රිකට් ලෝලියෙකු වන අනුපමගේ පියා කිත්සිරි, සැහැල්ලු දිවියක් ගතකරන විශ්‍රාමික ලිපිකරුවෙකි. අනුපමගේ මව චාන්දනී තාත්තාගේත් පුතාගේත් ක්‍රිකට් පිස්සුව ගැන නිතර දොස් කියයි. චාන්දනීගේ නිවසට යාබද නිවසේ වෙසෙන නිරාශා, ආච්චි සමග එකතු වී උදෑසන ආහාර විකිණීමේ සුළු ව්‍යාපාරයක් ආරම්භ කරයි. ආච්චීත් නිරාශාත් උදෑසන ආහාර පිසින අතර, නිරාශා එවා පාර්සල් බැඳ බයිසිකලයකින් ගොස් විකුණයි.

නිරාශාත් අනුපමත් ඉතා සමීප මිතුරන්ය. නිරාශාගේ සිතේ අනුපම කෙරේ මිත්‍රත්වය ඉක්මවා ගිය හැඟීමක් තිබේ. නමුත් අනුපම මෙය නොදනී. ඔහුට නිරාශා මිතුරියක් පමණි. කෝසල, නිරාශාට නිතර අනුපම අලලා විහිළු කරන්නේ ඔහුට නිරාශාගේ සිතැඟි වැටහෙන බැවිනි. චාන්දනී ද නිරාශාට බෙහෙවින් ආදරය කරන අතර ඇය, අනුපම හා නිරාශා කෙදිනක හෝ විවාහ වන්නේ නම් මැනවැයි සිතන්නීය.

Royal Food හි මුතු නමින් සේවයට පැමිණෙන සමාධි හා අනුපම අතර මිත්‍රත්වයක් ගොඩ නැගේ. ඒ මුතු හා අනුපම නමිනි. මේ අතර අනුපම හා රණබාහුගේ දියණිය වන සමාධි අතර දුරකථනය ඔස්සේ මිත්‍රත්වයක් ගොඩ නැගේ. අනුපම කෙරේ ආකර්ශනයකින් පසුවන මුතු , සමාධි ලෙසින් අනුපම හා මිත්‍ර වේ. අනුපම ද මුතු කෙරේ ආකර්ශනයකින් පසුවන අතර, මුතු එය නොදනී. නමුත් දුරකථනය ඔස්සේ සමාධි සමග මුතු පිලිබඳව අනුපම කථාකරයි. එහෙත් ඒ හැඟීම කුමක්ද යන්න සමාධිට හෝ නිශ්චිත නැත.

උද්‍යාන කෑම විකිණීමේ සුළු ව්‍යාපාරය ආරම්භ කරන දිනයේ ම Royal Food හි ඉදිරිපස පාරේදී, පූර්ණගේ මෝටර් රථයේ හැපී නිරාශා තුවාල ලබයි. මෙහිදී කලබල වන අනුපම, පූර්ණ හා ගැටේ. මේ අතර මනෝජ්ගේ යම් සැලසුමක් නිසා අනුපමට ක්‍රීඩා සමාජයේ ක්‍රිකට් කණ්ඩායමෙන් ඉවත් වීමට සිදුවේ. මෙය පූර්ණගේ සැලසුමක් බව සිතන අනුපමත් නිරාශාත් පූර්ණ කෙරෙහි දැඩි වෛරයකින් පසු වේ.නිරාශාගේ උත්සහාවන්ත කමත්, ඇයගේ දුප්පත් කමත්, තමා අතින් ඇයට වූ අසාධාරණයත් නිසා පූර්ණ, නිරාශාට උපකාර කිරීමට පෙළඹේ. නිරාශා එවා දැඩිව ප්‍රතික්ෂේප කරන අතර පූර්ණ, ඇයට හොරෙන් ඇයගේ දියුණුවට අවශ්‍ය ගමන් මාර්ගය සකසයි. එංගලන්තයේ සිටින අයේෂා නම් ඥාති සොයුරිය සමග විවාහ ගිවිස ගැනීමට සිටින පූර්ණ, එය ද ප්‍රතික්ෂේප කොට, ලංකාවේ දිගුකාලීනව සිටීමට තීරණය කරන්නේ ඔහුගේ සිත නිරාශා කෙරේ ආදරයෙන් බැඳුණු පසුවය. නමුත් අනුපම කෙරේ ආදරයෙන් පසුවන නිරාශා පූර්ණව ප්‍රතික්ෂේප කරයි.

වික්‍රම විසින් තම නිවසේ පවත්වාගෙන යන ඉංග්‍රීසි පන්තියට සහභාගි වන නිරාශා හා, එහි අඟබු ලෙස ඉගැන්වීමට එන සමාධි අතර මිත්‍රත්වයක් ඇති වේ. අනුපම රණබාහුගේ දියණිය ගැන උනන්දුවෙන් පසුවන බව දැන ගන්නා නිරාශා දුකටත් වේදනාවටත් පත්වේ. මේ අතර මුතු , අනුපම හා නිරාශා අතර පවතින සම්බන්ධය වටහා ගැනීමට තැත් කරයි. මුතු සිතන්නේ, නිරාශා හා අනුපම අතර ප්‍රේමයක් ඇතිබවයි.

මනෝජ්ගේ සොයුරු, රොෂාන් වංශනායකව සමාධිට විවාහ කරදීමට මනෝජ් සිතයි. ඒ අනුව ඔහු රොෂාන්, සමාධි අතර ප්‍රේම සම්බන්ධයක් ගොඩ නැගීමට තැත් කරයි. මාඩම්ගෙන් ලැබුනු දායාද නොයෙකුත් හේතු නිසා විනාශ කර ගන්නා මනෝජ්, රණබාහු පවුලේ ඉතිරි දේපල ලබා ගන්නා එකම ක්‍රමය රොෂාන්ට සමාධිව විවාහ කරදීම බව සිතයි. මේ සඳහා මනෝජ් විවිධ උපක්‍රම යොදයි. බොරු රෝගී තත්ත්වයක් මවා ගන්නා මනෝජ්, තමා යටතේ ඇති Royal Food හි කළමණාකාරීත්වයේ වැරදි ද පෙන්වා දෙමින්, Royal Food හි දියුණුවක් ඇති කරයි. මේ අතර සමාධි කෙරේ ආකර්ශනය වී සිටින රොෂාන්, ඇයට ආදරය කරයි. Royal Food හි මුතුලෙස කටයුතු කරද්දී ඔහුගේ සිත තව තවත් ඇය කෙරේ පැහැදේ. අසාධාරණ ලෙස ක්‍රිකට් කණ්ඩායමෙන් ඉවත් කරන අනුපමට, සාධාරණය ඉටු කරන්නේ රොෂාන් බැවින්, අනුපම හා රොෂාන් අතර ද මිත්‍රත්වයක් ගොඩ නැගී තිබේ. නමුත් ක්‍රමයෙන් මුතු හා අනුපම අතර ප්‍රේම සම්බන්ධයක් ඇතිවේ. මේ සම්බන්ධය සඳහා උපකාර කරන්නේ රණබාහු නිවසේ සිටින ලකී නම් මෙහෙකරුවාය. ලකී ජංගම දුරකථන උන්මාදයෙන් පෙලෙන්නෙකි. ඔහුගේ මෙම උන්මාදය මනෝජ් විසින් උපක්‍රමශීලීව යොදාගන්නේ රණබාහු පවුලේ විවිධ ව්‍යාපාරික හා පුද්ගලික රහස් පිලිබඳව දැනගැනීමට ය. අනුපම මුතු සමග ප්‍රේමය පටන් ගෙන සිටියදීත්, අනුපම ඒ සමාධි බව නොදනී. අනුපම මුතු සමග අනාගතය සැළසුම් කරයි. අනුපමගේත් මුතුගේත් සම්බන්ධය දැන ගන්නා නිරාශා අනුපමගෙන් මිදේ. මේ අතර පූර්ණ, නිරාශා පිළිබඳ සැලකිලිමත්වන බව දැන ගන්නා චාන්දනී, නිරාශා හා ආච්චි සමග අමනාප වන්නේ, ඇය අනුපමගේත් මුතුගේත් සම්බන්ධය නොදන්නා බැවිනි. නිරාශා ක්‍රමයෙන් දියුණු ව්‍යාපාරික කාන්තාවක් බවට පත් වෙද්දී, තමාට ඒ තැනට එමට උපකාර

කරන ලද්දේ පූර්ණ බව නිරාශා දැන ගනී. ඇයට පූර්ණව තවදුරටත් ප්‍රතික්ෂේප කළ නොහැකි මට්ටමක් ඇති වේ. නමුත් නිරාශාගේ සිත තුල, අනුපමව අභිබවා යාමට පූර්ණට ඉඩක් නැත.

මේ අතර වික්‍රම, නිරාශාගේත් සමාධිගේත් යම් යම් ක්‍රියාකාරකම් හා හැසිරීම් තුල පවතින සමානතා හඳුනාගනී. ඔහු ඒ අනුව නිරාශා පිළිබඳ සෙවීම ආරම්භ කරයි. අනුපම විවිධ අභියෝග හමුවේ ජනප්‍රිය ක්‍රිකට් තරුවක් බවට පත්වෙයි. අනුපමගේ ප්‍රේමයටත් වරින් වර විවිධ බාධා එල්ල වේ. අනුපමව අවසානයේ හිමි වන්නේ නිරාශාට ද සමාධිට ද යන්නත් , සමාධිට, රොෂාන්ගේ විවිධ ක්‍රියාකාරකම් හමුවේත්, පවුලේ බලපෑම අනුවත්, කුමන ඉරණමක් අත්වේ ද යන්න, කථාව ඉදිරියට ගලා යද්දී තීරණය වන්නකි.

මේ රැවල් විදාහල ආදර නෞකාව තෙරක් නොපෙනෙන සමාජ සාගරය මධ්‍යයේ තිතක් තරම්වත් බලාපොරොත්තුවක් සොයයි. ඔවුනට ආලයේ හරිත දූපත මුණ ගැසේවිද ? තෙරක් නොපෙනෙන මහ සයුර මැද මග හසර නොදැන ගිලී යාවිද..?

ප්‍රේමයේ දූත වෙස් ගෙන බලා සිටිමු අපි. ඔවුන් ප්‍රේමය හසුරනා යුරු.. අප අත් නොහැර අපත් සමගම , රැඳෙයි සදාකල්, **මුතු කිරිල්ලී**.. .. .. ..

ආදරයේ අත් තටු ලැබ ජීවිතයේ කෙමිඳීම සොයනා ඇප කිරිල්ලී

මුතු කිරිල්ලී

# මුතු කිරිල්ලී

## හැඩ වැඩ කරන්නෝ

| | | |
|---|---|---|
| අධ්‍යක්ෂණය | - | මිලන්ත කුමාරසිරි |
| නිෂ්පාදනය | - | සන්ධ්‍යා මෙන්ඩිස් |
| රූපවාහිනී රචනය | - | අරුණ ප්‍රේමරත්න |
| රූපවාහිනී රචනා සහාය | - | ගයාන් හෙට්ටිආරච්චි |
| රේඛීය නිෂ්පාදනය | - | සාලිය ද සොයිසා |
| සංගීතය | - | රෝහණ වීරසිංහ |
| ආලෝකකරණය සහ කැමරාකරණය | - | තිලක් රංජන් |
| අංග රචනය | - | සමීර මධු කිදෙල්පිටිය |
| කලා අධ්‍යක්ෂණය | - | අකුරම්බොඩ පියතිස්ස |
| සහාය අධ්‍යක්ෂණය | - | මහින්ද ප්‍රසාද් මස්ඉඹුල |
| සංස්කරණය | - | තිලංක නිරංජන් බණ්ඩාර |
| නිෂ්පාදන කළමණාකරනය | - | ජනක සම්පත් |
| තේමාගීත රචනය | - | බන්ඩුල නානායක්කාරවසම් |
| තාක්ෂණික උපකරණ,සංස්කරණ<br>මැදිරිය සහ සේවා | - | බන්දුල වීරක්කොඩි, ටෙලිස්ටාර් |

**ස්වාධීන රූපවාහිනිය සහ ස්කයිලාර්ක් ප්‍රොඩක්ෂන් තිළිණයක් ලෙසින්**

ආදරයේ අත් තටු ලඟ ජීවිතයේ කෙම්බිම සොයනා අපේ කිරිල්ලී — මුතු කිරිල්ලී